# ආර්ථික විද්‍යාව

රජය වෙළෙඳ පොළට මැදිහත් වීම නිසා සිදුවන
අහිමි වන සමාජ සුබ සාධනය හා
අහිමිවන සමස්ථ සුබ සාධනය හෙවත්
අඩුවන ආර්ථික අතිරික්තය

# වෙළෙඳ පොළට රජය මැදිහත් වීමේ දී අහිමි වන ආර්ථික අතිරික්තය හා අහිමි සමාජ ශුභ සාධනය

ඉල්ලුම් සැපයුම් බලවේග මත මිල හා ප්‍රමාණය තීරණය වන වෙළෙඳ පොළට රජය මැදිහත් වන ආකාර කීපයකි.

1. බදු පැනවීම.
2. සහනාධාර දීම.
3. උපරිම මිල පැනවීම.
4. අවම මිලක් පැනවීම. ( සහතික මිලක් නියම කොට මිල ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම ද සිදු කරයි.)
5. සළාකණය.

# රජය මැදිහත් වන බොහෝ විට අහිමි වන ආර්ථික අතිරික්තයක් හා අහිමි වන සුභ සාධනයක් පවතී.

•නමුත් , එසේ අහිමි වන ශුභ සාධනයක් නොපවතින අවස්ථා ද පවතී.

1.පූර්ණ අනම්‍ය ඉල්ලුමක දී.

2.පූර්ණ අනම්‍ය සැපයුමක දී.

• මෙම අවස්ථා දෙකෙහිදීම , අළෙවි වන ප්‍රමාණයේ හෝ

•මිලදී ගන්නා ප්‍රමාණයේ වෙනසක් ඇති නොවන බැවින්, අහිමි වන සමාජ සුභ සාධනයක් ඇති නොවේ.

• අහිමි සුභ සාධනයක් ඇති වන්නේ, අධි නිෂ්පාදනයක් හෝ ඌණ නිෂ්පාදනයක් නිසා පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයන්ගේ සිදුවන අඩුවීමය. අකාර්යක්ෂම නිමැවුම් මට්ටමක් වෙළෙඳ පොළට ප්‍රවේශ වූ විට මෙවැනි තත්වයක් ඇති වේ.

# පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින විට රජය බදු පැනවීම

- බදු පැනවීම :-




- බද්දට පෙර සමතුලිත මිල P වන අතර ප්‍රමාණය Q1 වේ. බද්දට පසු සමතුලිත මිල P1 වුවද ප්‍රමාණය වෙනස් නොවේ.බද්දේ ප්‍රමාණයෙන්ම මිල ඉහළ යයි.
- අළෙවි හෝ මිලදී ගැනීමේ වෙනසක් ඇති නොවන නිසා අහිමි ශුභ සාධනයක් ද නැත.
- මුළු බදු බරම පාරිභෝගිකයා දරණ නිසා පාරිභෝගික අතිරික්තය පමණක් අඩුවන අතර { (P1 – P) x Q1} නිෂ්පාදන අතිරික්තයේ වෙනසක් ඇති නොවේ.

# පූර්ණ අනම්‍ය සැපයුමක් පවතින විට රජය බදු පැනවීම

- බදු පැනවීම :-




- බද්දට පෙර සමතුලිත මිල P1 වන අතර ප්‍රමාණය Q1 වේ. බද්දට පසු සමතුලිත මිල වෙනස් නොවේ. පාරිභෝගිකයා P1 ම ගෙවනු ලබයි. එහෙත් එසේ ලැබෙන මුදලින් මුළු බද්දම නිෂ්පාදකයා විසින් (P1 – P අතර වෙනස) රජයට ගෙවයි.
- අලෙවි හෝ මිලදී ගැනීමේ වෙනසක් ඇති නොවන නිසා අහිමි ශුභ සාධනයක් ද නැත.
- මුළු බදු බරම නිෂ්පාදකයා දරණ නිසා නිෂ්පාදක අතිරික්තය පමණක් අඩුවන අතර පාරිභෝගික අතිරික්තයේ වෙනසක් ඇති නොවේ.

- මෙසේ පූර්ණ අනම්‍ය ඉල්ලුමක දී හෝ සැපයුමක දී අහිමි සමාජ ශුභ සාධනයක් ඇති නොවේ. සිදු වන්නේ පාරිභෝගික අතිරික්තයට හා නිෂ්පාදන අතිරික්තයට බලපෑමක් ඇති වීම පමණි.
- නමුත් පූර්ණ නම්‍ය අවස්ථාවලදී හෝ වෙනත් කුමන නම්‍ය අවස්ථාවක දී වුවද අහිමි ශුභ සාධනයක් ඇති වේ.

# පූර්ණ නම්‍ය සැපයුමක් පවතින විට රජය බදු පැනවීම

- බදු පැනවීම :-




- බද්දට පෙර සමතුලිත මිල P වන අතර ප්‍රමාණය Q වේ. බද්දක් පැනවූ විට සැපයුම් වක්‍රය බද්දේ ප්‍රමාණයෙන්ම ඉහළ යයි. බද්දට පසු සමතුලිත මිල P1 වේ. පාරිභෝගිකයා P1 ම ගෙවනු ලබයි. නමුත් මිල දී ගන්නා ප්‍රමාණය Q1 දක්වා අඩු වේ. ඌණ නිෂ්පාදනයක් හට ගනී.

- අලෙවි හා මිලදී ගැනීමේ වෙනස නිසා අහිමි ශුභ සාධනයක් ද ඇත. එය ප්‍රස්ථාරයේ පාට කළ කොටසින් පෙනේ.

- මුළු බදු බරම පාරිභෝගිකයා දරණ නිසා පාරිභෝගික අතිරික්තය ද අඩුවේ.

# පූර්ණ තරඟ ඉල්ලුමක් පවතින විට නිෂ්පාදකයා මත රජය බදු පැනවීම

බදු පැනවීම :-




- බද්දට පෙර සමතුලිත මිල P වන අතර ප්‍රමාණය Q වේ. බද්දක් පැනවූ විට සැපයුම් වක්‍රය බද්දේ ප්‍රමාණයෙන්ම ඉහල යයි. බද්දට පසු සමතුලිත මිල P වේ. පාරිභෝගිකයා P ම ගෙවනු ලබයි.

- නමුත් පාරිභෝගිකයා ගෙවන මිලෙන් කොටසක් නිෂ්පාදකයා විසින් රජයට ගෙවා මුළු බදු බරම නිෂ්පාදකයා දරයි. නමුත් වෙළෙඳපොළට සපයන ප්‍රමාණය අඩු කරයි.

- අළෙවි හා මිලදී ගැනීමේ වෙනස නිසා අහිමි ශුභ සාධනයක් ද ඇත.එය ප්‍රස්ථාරයේ පාට කළ කොටසින් පෙනේ.

- මුළු බදු බරම නිෂ්පාදකයා දරණ නිසා නිෂ්පාදක අතිරික්තය ද අඩුවේ.

# බදු බර බෙදී යාම , නිෂ්පාදන හා පරිභෝජන අතිරික්තය වෙනස් වීම.

- මෙය වෙනස් වනු ලබන්නේ ඉල්ලුම් සැපයුම් නම්‍යතාවය මත බදු ප්‍රමාණය බෙදී යන ආකාරය මතය.
- පූර්ණ නම්‍ය ඉල්ලුමක් පවතින විට මුළු බදු ප්‍රමාණය නිෂ්පාදකයා දරයි.
- පූර්ණ අනම්‍ය සැපයුමක් පවතින විට ද මුළු බදු බර නිෂ්පාදකයා දරයි.
- පූර්ණ නම්‍ය සැපයුමක් පවතින විට මුළු බදු ප්‍රමාණය හෝ පාරිභෝගිකයා දරයි.
- පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින විට ද මුළු බදු බර පාරිභෝගිකයා දරයි.
- ඉල්ලුමේ හා සැපයුමේ නම්‍යතා අගයන් සමාන වන විට, බද්ද සමානව බෙදී යයි.
- වඩා අනම්‍ය පුද්ගලයා වැඩි බදු ප්‍රමාණයක් ලබන අතර නම්‍ය පුද්ගලයා අඩුබදු ප්‍රමාණයක් දරයි.

- •නිෂ්පාදන බද්දක් පැනවීම නිසා ඌණ නිෂ්පාදනයක් හට ගනී. නිෂ්පාදනය අඩු වන විට MB > MC වන අතර එය ශුභ සාධනය අහිතකර වේ.
- •නිෂ්පාදන සහනාධාර ලබා දීම නිසා අධි නිෂ්පාදනයක් හට ගනී. නිෂ්පාදනය වැඩි වන විට MC > MB වන අතර එය ද ශුභ සාධනය අහිතකර වේ.
- •මෙහි දී අහිමි වන ශුභ සාධන සංකල්පය නිශ්චිතවම පෙන්නුම් කරනුයේ අධි නිෂ්පාදනයක් හෝ ඌණ නිෂ්පාදනයක් නිසා පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයේ සිදුවන අඩු වීමය.
- (සුභ සාධන ත්‍රිකෝණය, හර්බර් ත්‍රිකෝණය ලෙස ද මෙය හඳුන්වයි.)

## සමස්ත සමාජ ශුභ සාධනයේ අඩු වීම හෙවත් , ආර්ථික අතිරික්තයේ අඩු වීම:-

- පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයේ අඩු වීම පමණක් නොව, වෙළෙඳ පොළට රාජ්‍ය මැදිහත් වීම නිසා හට ගන්නා බදු බර ද සමාජ ශුභ සාධනය අඩු වීමට හේතු වේ.

# පාලන මිල (නීත්‍යානුකූල මිල) :-

## අවම මිල සහ උපරිම මිල

- උපරිම මිල :- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා අයකළ හැකි උපරිම නීත්‍යානුකූල මිල රජය විසින් නියම කිරීම වේ. ඊට වඩා වැඩි මිලක් අය කිරීම නීති විරෝධී වේ.
- අවම මිල :- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා රජය විසින් නියම කරනු ලබන අඩුම මිල වේ. ඊට වඩා වැඩි මිලක් අය කිරීම නීති විරෝධී වේ.
- වෙළෙඳ පොළ ඉල්ලුම් සැපයුම් බලවේග මත තීරණය වන මිල ගැණුම්කරුවන් සම්බන්ධයෙන් හෝ සැපයුම් කරුවන් සම්බන්ධයෙන් අසාධාරණ මිලක් ලෙස රජය දුටු විට මෙවැනි උපරිම හෝ අවම මිලක් පනවයි.

# උපරිම මිල




- උපරිම මිලක් පැනවීම නිසා නිෂ්පාදනයේ Q0 සිට Q1 දක්වා ඌණ නිෂ්පාදනයක් ඇතිවේ. ඌණ නිෂ්පාදනය නිසා කොළ පාටින් දක්වා ඇති පරිදි අහිමි වන ශුභ සාධනයක් ඇති වේ.

# උපරිම මිල




- උපරිම මිලක් පැනවීම නිසා නිෂ්පාදනයේ කළු කඩ මිලක් ඇතිවේ. (p2)

උපරිම මිල නිසා,

- අධි ඉල්ලුමක් බිහිවේ.
- නිෂ්පාදන අතිරික්තය අඩු වේ.
- පාරිභෝගික අතිරික්තය වැඩිවේදැයි නිශ්චිතව කිව නොහැක.
- භාණ්ඩ ලබා ගැනීමට පෝලිම් වල සිටීමට හෝ භාණ්ඩ සොයමින් ඇවිදීමට සිදුවිය හැකිය.
- කළු කඩ මිලක් බිහි වීමට ද පුලුවන.

උපරිම මිල අර්ථවත් කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග-:

-ආනයනය

-සළාක කිරීම.

-නිෂ්පාදකයන් දිරි ගැන්වීම

# අවම මිල




- අවම මිලක් පැනවීම නිසා නිෂ්පාදනයේ Q1 සිට Q0 දක්වා අධි නිෂ්පාදනයක් ඇතිවේ. එම අධි නිෂ්පාදනය නිසා , කොළ පාටින් දක්වා ඇති පරිදි අභිමි වන ශුභ සාධනයක් ඇති වේ.

අවම මිල අර්ථවත් කිරීම සඳහා ක්‍රියා මාර්ගගත හැකිය.

එනම්,

අතිරික්තය ගබඩා කිරීම

අතුරු නිෂ්පාදන බිහි කිරීම

පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය

අපනයනය

# අවම මිල සහතික මිලක් කොට රජය මිල දී ගැනීම.




සහතික මිලක් නියම කොට රජය මිල දී ගැනීම නිසා නිෂ්පාදනයේ Q0 සිට Q2 දක්වා අධි නිෂ්පාදනයක් ඇතිවේ. මෙම අධි නිෂ්පාදනය නිසා කොළ පාටින් දක්වා ඇති පරිදි අහිමි වන ශුභ සාධනයක් ඇති වේ. එනම් අකාර්යක්ෂම සම්පත් භාවිතයකි. Q0 සිට Q2 දක්වා වන සෑම ඒකකයක් සඳහාම සැපයුම් මිල (ආන්තික පිරිවැය) ඉල්ලුම් මිල (ආන්තික ප්‍රතිලාභ) ඉක්මවා ගොස් ඇත. MC > MB මේ නිසා ඉහත පරිදි අහිමි වන සමාජ ශුභ සාධනයක් ඇති වේ.

# අවම මිල සහතික මිලක් කොට රජය මිල දී ගැනීම.



- අභිමි වන සමාජ ශුභ සාධනයට වඩා අභිමි වන ආර්ථික අතිරික්තය හෙවත් සමස්ථ සමාජ ශුභ සාධනය ඉහළ අගයක් ගනී.
- රජය මිලදී ගැනීමේ පිරිවැය ද සළකා පෙර ආර්ථික අතිරික්තය හා රජය මිල දී ගැනීම නිසා පසු ආර්ථික අතිරික්තයේ වැඩි වීම ගණනය කොට , එම වැඩි වීමෙන් රජයේ වියදම අඩු කල විට අභිමි වන සමස්ථ සුභ සාධනයේ වෙනස හෙවත් ආර්ථික අතිරික්තයේ අඩු වීම ලැබේ. ඒ අනුව කොළ පාටින් එය දක්වා ඇත.

# අවම මිල සහතික මිලක් කොට ඌණ පූරණය කිරීම



• සහතික මිලක් නියම කොට ඌණ පූරණය කරන විට , පාරිභෝගිකයා කැමති මිලකට භාණ්ඩ ලබා දීමෙන් පසු, රජය විසින් පාරිභෝගිකයා ලබා දුන් මිලත් සහතික මිලත් අතර වෙනස රජය විසින් නිෂ්පාදකයාට ලබා දේ. එවිට නිෂ්පාදක අතිරික්තය මෙන්ම පාරිභෝගික අතිරික්තය ද ඉහළ යයි. මේ නිසා නිෂ්පාදනයේ Q0 සිට Q2 දක්වා අධි නිෂ්පාදනයක් ඇතිවේ. මෙම අධි නිෂ්පාදනය නිසා කොළ පාටින් දක්වා ඇති පරිදි අහිමි වන ශුභ සාධනයක් ඇති වේ. එනම් අකාර්යක්ෂම සම්පත් භාවිතයකි. Q0 සිට Q2 දක්වා වන සෑම ඒකකයක් සඳහාම සැපයුම් මිල (ආන්තික පිරිවැය) ඉල්ලුම් මිල (ආන්තික ප්‍රතිලාභ) ඉක්මවා ගොස් ඇත. MC > MB මේ නිසා ඉහත පරිදි අහිමි වන ශුභ සාධනයක් ඇති වේ.

# අවම මිලසහතික මිලක් කොට ඌණ පූරණය කිරීම



- මෙසේ ඌණ පූරණ මිල ආධාරක වැඩසටහනක් රජය ගෙන යන්නේ නම්,

නිෂ්පාදකයාගේ මෙන්ම පාරිභෝගිකයාගේ ද අතිරික්තය වැඩි වේ.එහෙත් අධි නිෂ්පාදනය නිසා ( Q0 - Q2 ) අහිමි ශුභ සාධනයක් ඇති වේ.

- මේ අනුව රජය මැදිහත් වීම නිසා වෙළෙඳපොළේ අධි නිෂ්පාදනයක් හෝ ඌණ නිෂ්පාදනයක් සිදුවන්නේ නම්, ආන්තික ප්‍රතිලාභ හා ආන්තික පිරිවැය අතර වෙනසක් හට ගනී. ඒ හේතුවෙන් අහිමි ශුභ සාධනයක් ඇති වේ.

- නමුත් ආර්ථික අතිරික්තයේ අඩු වීම යනු සමස්ත සමාජ ශුභ සාධනයේ අඩු වීමයි.

# මිල ස්ථායීකරණය සඳහා ආණ්ඩුව මැදිහත්වීම

භාණ්ඩ වල මිල ස්ථායීකරණය සඳහා ගොවීන්ගේ ආදායම ස්ථාවරත්වයකට පත් කිරීම සඳහා සුලභ වශයෙන් යොදා ගැනෙන ක්‍රියා මාර්ග කීපයක් පහත දැක්වේ.

1. සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීම.
2. ඌණ පූරණ ගෙවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
3. නිෂ්පාදන සළාක හෙවත් කෝටා ලබා දී සැපයුම සීමා කිරීම.
4. භූමිය වගාව සඳහා යොදා නොගැනීම දිරිමත් කිරීම පිණිස ගෙවීමක් කිරීම.
5. ස්වාරක්ෂක තොග රැස් කිරීම හා මුදා හැරීම.
6. අපනයන සහනාධාර ලබා දීම.
7. වෙළෙඳ පොළ තත්ත්වය පිළිබඳ නිවැරදි තොරතුරු කල් තියා සැපයීම
8. යෙදවුම් සහනාධාර ලබා දීම.
9. මෙහෙයුම් අලාභ ආවරණය කිරීම පිණිස ආධාර සැපයීම.

# නිමි.

සැකසුම - තමරා කාරියවසම්
දකුණු පළාත